# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2011**
**2013 මැයි - අගෝස්තු**

**සමාජීය විද්‍යා පීඨය**

**ආර්ථික විද්‍යාව - ECON- E 1015**

**ආර්ථික විද්‍යාවේ මූලධර්ම**

**ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. අ) නිදහස් වෙළඳපොල අර්ථ ක්‍රමයක ප්‍රධාන ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 05)

ආ) ''අදෘශ්‍යමාන හස්තය'' යන්න මගින් අදහස් වන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු05)

ඉ) නිෂ්පාදන හැකියා පර්යන්තය මගින් පෙන්වන්නේ මොනවාද? (ලකුණු 05)

ඊ) ආවස්ථික පිරිවැය යන පදයෙන් අදහස් වන්නේ කුමක්ද? එය හිඟකම සමඟ සම්බන්ධ වන්නේ කෙසේද? (ලකුණු 05)

02. පහත ඒවාට පිළිතුරු සැපයීමේ දී රූප සටහන් භාවිත කරන්න.

අ) පහත දැක්වෙන දෑ භාණ්ඩ හා සේවා වෙළෙඳපොල සඳහා හඳුන්වා දීම මගින් සිදුවිය හැකි බලපෑම් මොනවාද?

1. උපරිම මිල පාලනය (ලකුණු 04)
11. නිෂ්පාදන පිහිටාධාර (ලකුණු 04)
111. නිෂ්පාදන මත බද්දක් පැනවීම (ලකුණු 04)

ආ) පහත දැක්වෙන පද මගින් ඔබ අදහස් කරන්නේ කුමක්ද?

1. පාරිභෝගික අතිරික්තය (ලකුණු 04)
11. නිෂ්පාදන අතිරික්තය (ලකුණු 04)

03. අ) නිෂ්පාදනයක මිල වෙනස්වීම එහි ඉල්ලුම දක්වන ප්‍රතිචාරය ආර්ථික විද්‍යාඥයින් මනිනු ලබන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

ආ) මිල ඉල්ලුම් නම්‍යතාව තීරණය කරන සාධක ලියා දක්වන්න. (ලකුණු 04)

ඉ) පහත ඒවා නිර්වචනය කරමින් පැහැදිලි කරන්න.

1. හරස් මිල ඉල්ලුම් නම්‍යතාව (ලකුණු 03)
11. ආදායම් ඉල්ලමු නම්‍යතාව (ලකුණු 03)

04. අ) ආයතනයක මුළු පිරිවැය ශ්‍රිතය $TC = Q^3 - 10Q^2 + 40Q + 50$ ලෙස දී ඇත. ආයතනයේ TVC, TFC, AVC, AC සහ MC සඳහා ප්‍රකාශන ලබාගන්න. (ලකුණු 10)

ආ) සාමාන්‍ය පිරිවැය වක්‍රය හා ආන්තික පිරිවැය වක්‍රය අතර පවත්නා සම්බන්ධතාව විස්තර කරන්න. (ලකුණු 05)

ඉ) දිගුකාලීන සාමාන්‍ය පිරිවැය වක්‍රය (LRAC) U හැඩයක් ගන්නේ මන්ද? (ලකුණු 05)

05. අ) ස්වාභාවික ඒකාධිකාරය (Natural Monopoly) නිර්වචනය කරන්න. ස්වාභාවික ඒකාධිකාරය පවතින්නේ මන්ද? (ලකුණු 05)

ආ) කෙටිකාලීන සාමාන්‍ය පිරිවැය (AC) සහ ආන්තික පිරිවැය (MC), සහ සාමාන්‍ය අයභාර හා ආන්තික අයභාර (AR හා MR) වක්‍ර දක්වමින් ඒකාධිකාරී ආයතනයක පැහැදිලි රූප සටහනක් අඳින්න. (ලකුණු 05)

ඉ) මෙම රූප සටහන භාවිතයෙන් නිමවුම් මට්ටම සහ මිල තීරණය වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 05)

ඊ) ඒකාධිකාරී ආයතනයක සැපයුම් වක්‍රයක් නොමැති වන්නේ මන්ද? (ලකුණු 05)

06. අ) "මුදලේ කාර්යභාරය අනුව මුදල් නිර්වචනය කළ හැකිය." සාකච්ඡා කරන්න. (ලකුණු 10)

ආ) ශ්‍රී ලංකා මහ බැංකුවට මුදල් සැපයුම පාලනය කිරීම සඳහා පවත්නා උපකරණ විස්තර කරන්න. (ලකුණු 10)

07. අ) ආවෘත අර්ථ ක්‍රමයක් පිළිබඳ පහත දක්වෙන තොරතුරු ඔබ සතුව පවතී යැයි සලකන්න.

$$C = 50 + 0.80\,(Y - T)$$

$$I = 200$$

$$G = 100$$

1. සමතුලිත ජාතික ආදායම් මට්ටම සොයන්න. (ලකුණු 04)

11. G හි අගය 125 දක්වා වැඩි වූයේ යැයි සලකන්න. නව සමතුලිත ජාතික ආදායම් මට්ටම කුමක්ද? (ලකුණු 04)

111. ඉලක්ක කරන ලද 200 ආදායමක් අත්පත් කර ගැනීම සඳහා අවශ්‍ය G වල මට්ටම කුමක්ද? (ලකුණු 04)

ආ) $C = 140 + 0.6\,Yd$, $T = 0.4\,Y$, $I = 1000$, $G = 750$ නම් සමතුලිත ජාතික ආදායම් මට්ටමේ දී පරිභෝජනය, ඉතුරුම් සහ බදු ආදායම සොයන්න. (ලකුණු 08)

08. පහත ඒවා පිළිබඳ සටහන් ලියන්න.

අ) මිල විශ්ලේෂණය

ආ) කතිපයාධිකාරය

ඉ) විචල්‍ය සාධක අනුපාත නියමය

ඊ) ආන්තික පරිභෝජන නැමියාව (ලකුණු 20)

******************************